## මාධ්‍ය නිවේදනය

## අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

2018 මාර්තු මස 12 වෙනි දින

පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජයේ නියෝජිතයින්ගෙන් සමන්විත ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය පරිදි අතිගරු` මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් 2018 පෙබරවාරි මස 28 වෙනි දින අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්‍යයාලයේ සභාපති සහ සාමාජිකයන් පත්කිරීමෙන් අනතුරුව එම කාර්යාලය ආරම්භ වි ඇත . මෙම කාර්‍යයාලයේ ප්‍රධාන අරමුණ වනුයේ දශක ගනනාවක් පුරා බහුවිධ ගැටුම් තත්වයන් හේතු කොට ගෙන අතුරුදහන් වූ තැනැත්තන් ගේ පවුල් අත්විඳින මහත් වේදනාවන්ට සහනයන් සැලැස්වීමයි .

මෙම කාර්‍යයාලය රටපුරා ජීවත්වන අතරුදහන් වීම් නිසා විපතට පත් සියලු ජන කොටස් වලට ජනවර්ගය, ආගම හෝ කලාපීය වශයෙන් කිසිදු භේදයකින් තොරව සේවය ලබාදීමට බැඳී සිටියි. මින් පෙර පැවති ආණ්ඩු විසින් විවිධ කොමිෂන් සභා පත් කළද බොහෝ කාලය ගතවුවද සිය ආදරණීයයන්ට අත්වූ ඉරණම කුමක්දැයි නොදැන මෙම පවුල් තවමත් ලත වන අතර සිදුවුයේ කුමක්ද යන්න දැන ගැනීමට ඔවුන් තවමත් විශාල වෙහෙසක් දරමින් සිටියි.

මෙම කාර්යාලය පැහැරගෙන යාමේ වින්දිතයන් වශයෙන් අතුරුදහන් වූ සාමාන්‍ය පුරවැසියන්, ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, පොලිස් නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක නිලධාරීන් , සටන් වලදී හෝ අන්‍යාකාරයෙන් සන්නද්ධ ගැටුම් වලට අදාළව අතුරුදහන් වූ දහස් ගන්නක් වන තැනැත්තන් සම්බන්ධයෙන් කරුනු සොයා බැලීමට ස්ථාපිත කර ඇත .

පනතේ විධි විධාන අනුව (අ) අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම (ආ) අතුරුදහන් වු තැනැත්තන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳීයාවන් ආරක්ෂා කිරීම (ඇ) අතුරුදහන් වූ තැනැත්තන් හෝ ඔවුන්ගේ ඥාතීන්ට ලබා දිය හැකි සහන හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම (ඈ) පුද්ගලයන් අතුරුදහන්වීමේ සිද්ධීන් නැවත ඇති නොවීම සදහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම කාර්‍යයාලය වෙත පැවරී ඇති කාර්යයන් වන්නේය.

මෙම කාර්‍යයාලයේ සාමාජිකයන් සමාජයේ විවිධ ස්ථරයන් නියෝජනය කරන මානව හිමිකම් ක්‍රියාධරයන්, විශ්‍රාමික පරිපාලන නිලධාරීන් සහ වෘත්තිකයන් මෙන්ම අතුරුදහන් වූ පවුල්වල සාමාජිකාවකගෙන් ද ශ්‍රී ලංකාවේ යුද හමුදාවේ සේවය කළ විශ්‍රාමික නීති උපදේශිකාවකගෙන්ද සමන්විත වේ. අපි, ගැටුම් වලින් විපතට පත්වූ සියලු දෙනාගේම සුබසිද්ධිය වෙනුවෙන් හදපත්ලින්ම කැපවුනු පුද්ගලයන් වන්නෙමු. එසේම පාර්ලිමේන්තුව විසින් අප වෙත පවරා ඇති භාරදූර රාජකාරිය පිලිබඳව ද නිසි අවබෝධයකින් සිටිමු. අප වෙත පැවරී ඇති කාර්යයන් අපක්ෂපාතිව ස්වාධීනව ඉටු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවබෝධයෙන් සිටිමු . එසේම අපගේ සියලු කාර්යයන් ඉටු කිරීමේ දී අතුරුදහන් වූ පවුල් වලට ද අතුරුදහන් වූවන් වෙනුවෙන් ද අපේ වගකීම සුවිශාල බව අපි තේරුම් ගෙන සිටිමු.

අතුරුදහන් වූවන් සොයා බැලීමට අදාළ අභියෝගයන් විවිධාරකාරය. එසේම සංකීර්ණය. මේ නිසාම මෙම කාර්යාලය ස්ථිර ආයතනයක් ලෙස ස්ථාපිත කර ඇත. මින් පෙර ස්ථාපිත කරන ලද ආයතන සහ යාන්ත්‍රණයන්ගෙන් මෙම කාර්යාලය වෙනස් වනුයේ තාවකාලිකව හෝ කෙටි කාල සීමාවන්ට අනුව අතුරුදහන් වීම් සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද සහ පිහිටුවන ලද ආයතනයක් නොවන හෙයිනි. එම යාන්ත්‍රණ අතුරුදහන් වූවන් ලේඛන ගත කිරීමට සහ යෝජනා

ඉදිරිපත් කිරීම වැනි නිශ්චිත කාර්යයන් සඳහාම පමනක් පත්කර තිබිණි. මෙම කාර්‍යයාලය අතුරුදහන්වූවන් සෙවීම සහ ඔවුන් සොයා ගැනීමට අදාළ සියලු පියවර ගැනීමේ බලතල සහිතව ස්ථාපිත කර ඇත. එම කාර්යාලයේ සාමාජිකයන් වන අපි විශ්වසනීයත්වයෙන් යුත් කාර්යක්ෂම සහ ශක්තිමත් ආයතනයක් ස්ථාපිත කිරීමෙන් විපතට පත් පුද්ගලයන්ට සහ ප්‍රජාවට දීර්ඝ කාලීනව සහනයක් ලබාදීමට වගකීමක් දරමු.

මින් පෙර ස්ථාපිත කොමිෂන් සභා වල යෝජනා සහ අත්දැකීම් ද අනිවාර්යයෙන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. එසේම සාකච්ඡා සහ සංවාදශිලි ක්‍රියාදාමයන් හරහා වින්දිතයන්ටද අදාළ වෙනත් පාර්ශවයන්ටද සවන් දීම මූලික වන අතර සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධ ප්‍රවීචාරණ කාර්යසාධක කමිටුවට අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් කරන ලද විශේෂ යෝජනා ද සැලකිල්ලට ගනු ඇත. අපගේ මැදිහත්වීම් වින්දිතයන් කේන්ද්‍රියවූ මූලධර්මයන් මත මෙහෙයවනු ඇත. එසේම මෙම කාර්යාලය තිරසර සාමයක් සහ සංහිඳියාව අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පිහිටුවීමට බලාපොරොත්තු වන යාන්ත්‍රණ හතරෙන් එකක් බවද අවධාරණය කළ යුතුව ඇත.

මෙවැනි යාන්ත්‍රණයක අවශ්‍යතාවය බොහෝ කලක සිට පැවතෙන බව අපි පිලිගනිමු. සිය ආදරණියයන් නැතිවීම සහ අතුරුදහන් වීම නිසා අතුරුදහන් වූ තැනැත්තන් ගේ පවුල් දුක් විඳ ඇත . වසර ගනනාවක්ද දශක කිහිපයක් පුරාද බොහෝ දෙනෙක් බලා සිටින්නේ සිය ආදරණීයයන්ට කුමක් සිදුවූයේද යන්නත් ඔවුන් ජීවත්ව සිටින්නේද නැද්ද යන්න දැන ගැනීමටත්ය. දිගු කාලයක් එසේ බලා සිටීම නිසාම ඔවුන් මහත් වේදනාවෙන් මෙන්ම බලාපොරාත්තු සුන්වීමෙන්ද කලකිරීමට පත්ව ඇති බව අපි දනිමු. මෙම පනතෙන් අප වෙත පැවරී ඇති කාර්ය භාරයන් සාර්ථක කර ගැනීම සඳහා තිරසර සාමය සහ සංහිඳීයාව අනාගත පැතුම වන සියලු දෙනාගේම සහයෝගය සහ ශක්තිය අපට ලබා දෙන ලෙස ආරාධනා කරමු.

**ජනාධිපති නීතිඥ සාලිය පීරිස්**

**සභාපති**

**අතුරුදහන්වූ තැනැත්තන් පිලිබඳ කාර්යාලය**